සමාජයේ සිදුවන යම් සිදුවීමක් පුවතක් ලෙසින් හෝ වෙනත් අයුරකින් ඉදිරිපත් කිරීමේදී, එය සමාජගත කරනා ආකාරය පිළිබඳ බැරෑරුම් වගකීමක් මාධ්‍යයකට තිබේ. එම සිදුවීම හා බැඳි සමාජ ගැටළුව පිළිබඳව නිවැරදි කතිකාවක් ඇතිවිය හැකි ආකාරයෙන් තොරතුරු ලබාදීම එම වගකීමට අයත් වේ.
නමුත් සෑම සියළු මාධ්‍යයක්ම මෙම වගකීම සෑමවිටම ඉටු කරන්නේද යන්න පැනයකි.
දිවයින පුවත්පතේ එක්තරා කොලමකින් ඉදිරිපත් වන්නේ සමාජය තුළ දක්නට ලැබෙන මෙවැනි ගැටළු වේ. ජූනි 17 දින මෙම කොලමේ සිරස්තලය වන්නේ "සෙව්වන්දිගේ මොළේ අවුල් කළ කසිකබල් ටෙලි නාට්‍ය" යන්නයි
මෙයට පාදක සිදුවීම වන්නේ බාලවයස්කාර දැරියකට සිදුකළ ලිංගික අපරාධයකි. ඒ පිළිබඳව කළ හැකි නිරීක්ෂණ මෙසේයි.
1) කොලම පුරාම එම අපරාධය එම දැරියගේ බලකිරීම මත සිදුවූවක් බව පෙන්වීමට උත්සාහ දරා තිබේ. නමුත් නීතිය ඉදිරියේදී, බාලවයස්කරුවෙකුගේ කැමැත්ත මත සිදුවන ලිංගික සබඳතාවයක් වුවද "ව්‍යවස්ථාපිත ලිංගික අපරාධයක්" ලෙසින් දැක්වේ. මෙම ලිපිය පුරා වින්දිතයාට දෝෂාරෝපණය කෙරෙන අතර, සිදුවූ ලිංගික අපරාධය කෙතරම් බරපතළ කරුණක්ද යන්න කිසිසේත්ම සඳහන් නොවේ.
2) වින්දිත බාලවයස්කාර දැරියගේ බාහිර රූපකාය භාවාත්මක ලෙසින් දැක්වීමක්ද මෙම ලිපිය තුළ දක්නට ලැබේ.
3) අවසාන වශයෙන් ගත් විට, මෙම බාලවයස්කාරියගේ සම්පූර්ණ ජීවිතය "විනාශ වී ඇති බව" ද මෙම ලිපිය තුළින් පුන පුනා ප්‍රකාශ වේ.
ලිංගික අපරාධයක ඇති බරපතළ බව සැහැල්ලු කරමින්, වින්දිතයාටම දෝෂාරෝපණය කරනා මෙවැනි කොලමක් කෙතරම් දුරට මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කරයිද? එය කෙතරම් දුරට සමාජයට සෘණාත්මක අදහස් ලබාදෙන්නේද? එය කෙතරම් දුරට සිය සමාජ වගකීම නොසලකා හැරීමක්ද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?
#MediaEthicsSL #lka #sinhalanews #Divaina